# අහිමි වූ සෙනෙහස



# අහිමි වූ සෙනෙහස

## කතෘ - ලිවිනි ජයෝදායා රඹුක්වැල්ල

කතෘ ලිවිනි ජයෝදායා රඹුක්වැල්ල

මහාමයා බාලිකා විදුහල මහනුවර

ISBN

දිනය

# පිදුම

මහාමායා  බාලිකා විදුහලේ ගුරු
විදුහල්පතිතුමියටත්,

පංතිභාර ගුරුතුමිය

ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්,

මට දිරියක් වන මාගේ දෙමාපියන්ටත්,

මගේ යාලුවන්ටත්

මෙම පොත ආදරෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර 2023.

11 . 01

"අනේ මන්ද ඩෝගි ඔයා නම් නිවාඩු දවසටත් ඇවිල්ල මාව උදෙන්ම නැගිට්ටනවනේ" ඩෝගි නැට්ට වනමින් ලෙවනාාගේ ඇද මත දුව පැනමින් කෑ ගැසුවේය.

"හරි හරි අපි දෙන්න ලෑස්ති වෙලා යන්කෝ ඇවිදින්න" ලෙවනාා මුහුණ සෝදා පිරිසිදු වී ලස්සන ගවුමක් ඇද ඩොගීටත් කර පටිය දමා දෙදෙනාත් සමඟ ගෙදරින් පිටව ගියේය.



''ඉතින් යාලුවනේ ඔයාල බලනවා ඇති කවුද මේ ලෙවනාායි ඩොගී කියන්නේ කියල , ඉතින් මේ ලෙවනාා කියන්නේ තමන්ගේ අම්මා,තාත්තා හා තමන්ගේ එක කුස උපන් සහෝදරයන් දෙදෙනාගෙන්ද වෙන් වී සිටින තමාගේ නිදහස් ජීවිතය තමාම සොයා ගැනීමට උත්සාහ කරන හරිම හැඩකාර,කටකාර,හුරුබුහුටි කෙල්ලෙකි.ඩෝගි කියන්නේ එයාට ඇහුම්කම් දෙන,එයාගේ තනියට ඉන්න එකම කෙනා ඒ හරිම හුරුබුහුටි,බූල් ගොඩක් තියන ,මීටර භාගයක් විතර උස,කළු දුඹුරු පාට  ලස්සන බලු පැටියෙකි.''

එහෙනම් යාලුවනේ අපි ආපහු යමු මේ දෙන්නගෙ කතාවට,

ඉතින් මේ දෙන්න දවස පුරාම ඇවිදල ඇවිදල ඇවිල්ල දෙන්නටම හොදටම මහන්සී.ඒ නිසාම ටිකක් වෙලා පුටුවට වෙලා ඉදන් හිටපු ලෙවනාාට එහෙමම නින්ද ගියා .ඩොගීත් ඇවිල්ල එතනම හාන්සි උනා. එක වරම ගෙදර සීනුව නාද විය .ලෙවනාාත් ඩෝගීත් එක්වරම ඇහැරියේය.

ලෙවනාා ගොස් දොර විවර කළේය.දොරින් පිට සිටි අය දැක ලෙවනාාගේ සිත තිගැස්සී ගියේය. අවුරුදු 5ට පසු තමාගේ එක කුස උපන් මල්ලීත්,අයියාත් තමා සොයා ගෙන පැමිණේ යැයි කිසිදා ලෙවනාා  සිතුවේ නැත.

"අනේ මේ ඇත්තක්ද මේ ඇත්තටම එයාල මාව හොයන් ඇවිල්ලද අවුරුදු 5ට පස්සෙ එයාලට මාව මතක් වෙලා මට හිතා ගන්නවත් බෑ...... මම එයාලව දකින්නේ අවුරුදු 5කින්  එයාල ගොඩක් ලොකු වෙලා ලස්සන වෙලා"



ඇය ඇයටම කියා ගත්හ.

ඇයගේ ඇස්වල කඳුළු පිරී තිබුනි.

ලෙවන්‍යාගේ අයියා ඔහුගේ හඩ විවෘත කළේය.

"න0ගී ඔයාට තාම අපිව  මතක ඇති කියල මම හිතනවා.......මම ඔයාගේ එකම අයියා සෙවාන් " අයියාගේද දෙනෙත් කඳුළුවලින් තෙත් විය.

"ඔව් අයියේ මට කොහොමද ඔයාලව අමතක කරන්නේ" ලෙවනායා සෙවාන්ව බදා ගනිමින් කීවේය.

"මල්ලී ඔයා ගොඩක් ලොකු වෙලා මට අඳුර ගන්නත් බැරි උනා"

" හරි හරි නංගී අපි ඒව පස්සෙ කතා කරමු ඔයා අපිට ගේ ඇතුලට එන්න කියලා ආරාධනා කරන්නෙ නැද්ද" සෙවාන් සිනා සෙමින් කිවුවේය.

අනේ සමාවෙන්න අයියේ මට ඒකත් අමතක උනා......

එන්න එන්න ගේ ඇතුලට.

"අනේ හරිම ලස්සන ගෙයක් ඔයා කොච්චර තනියම හිටියත් ගෙදර හරි ලස්සනට පිරිසිදුව තියන් ඉන්නවා නේද….."

ලෙවනායා අයියා දෙස බලා සිනාසුනි.

"වාඩිවෙන්න අයියේ මම බොන්න මොනා හරි හදන් එන්නම්කෝ….."

"අයියේ ……….. මේ මගේම අක්කද ?" ලෙවනායාගේ එකම මල්ලිය වන සදෙව් ඔහුගේ හඩ විවෘත කළේය.

"මල්ලි ඇයි ඔයා එහෙම අහන්නෙ " සෙවාන් තරහින් සදෙව්ගෙන් ඇසීය.

''අයියෝ අයියේ තරහ ගන්න නෙවෙයි අනේ කිවුවෙ මම ගොඩක් චූටි කාළෙදිනේ අක්ක මෙහේ අවේ ඉතින් මම අක්කව දැකල තියන්නෙ පින්තූරවල විතරනේ....''

''අනේ මල්ලි සමාවෙන්න මට ඒක අමතක උනානේ''

''අයියේ අක්ක හරිම ලස්සනයි නේද..........''

''ඔව් මල්ලි අක්ක පොඩි කාලේ ඉඳන්ම ලස්සනයි

ඉස්සර අපේ ඉස්කෝලේ හිටිය  ලස්සන කෙල්ල තමයි ඔයාගේ අක්කා''

''අයියේ,මල්ලි එහෙනම් මේක බොන්නකෝ

ඔයාල එනව කියල මම කලින් දන්නවන්ම් මොනා හරි හදල තියනවනේ''

''ඒකට කමක් නෑ නoගී

''ඉතින් නoගි මෙහේ තනියම ඉන්න එපා වෙන්නෙ නැද්ද?''

'' අපෝ නෑ අයියේ මම මේහේ ඉන්නේ තනියම නෙවේ .මම එයා එක්ක මෙහෙට වෙලා ඉන්නේ හරිම සතුටින් ''

''කවුද නoගී මේ ගෙදර තව ඉන්නේ''සෙවාන් තරඟින් ඇසුවේය.

''ඉන්නකෝ මම එයාව ඔයාලට අඳුනල දෙන්නම්''

ලෙවනායාගේ ගිහින් ඩෝගිව එක්කන් ආවා.

''අනේ හරිම ෂෝක්නේ අක්කේ ඔයා මෙයා එක්කද ඉන්නේ''

''ඔව් මල්ලි මගේ හැමදේටම මට ඉන්නේ මෙයා තමයි ''

''මොකක්ද අක්කේ මෙයාගේ නම''

''මෙයාගේ නම ඩෝගී''



‘’නංගී ඇත්තටම අපි දෙන්නා මෙහාට ආව කරනේ ගැන කතා කරන්නම්කෝ.... ඔයා ගෙදරින් ගියාට පස්සෙ අපි ගොඩක් දුක් උනා අම්මට සනිපත් නැති උනා අපි දැන් අවුරුදු දෙකක විතර ඉදන් ඔයා ඉන්න තැනක් හොයනවා ඒත් අපිට හම්බ උනේ නෑ ඔයා කොහෙද ඉන්නේ ඔයා හොදින් ඉන්නවද මේ කිසිම දෙයක් දැනගන්න හම්බවුනේ නෑ ...අහම්බෙන් මගේ යාලුවෙක් ඔයාව දැකල මට කිවුවා ඔයා ඉන්නේ මෙහේ කියල ඉතින් එදා ඉදන් මම ගොඩක් හෙවුවා ඔයා දිහා බලාගෙන හිටියා ඇත්තටම ඔයා තනියම ඔයාගේ ජීවිතේ මේ තරම් ලස්සන කර ගෙන තියන එක ගන මට ගොඩක් සතුටුයි නංගී........ ඒත් ඔයා නැතුව අපි මේ අවුරුදු 5ම අපි ජීවත් උනේ හරියට මලකදවල් වගේ නංගී අම්මයි තාත්තයි ගොඩක් දුක් වෙනවා ඔයා නැතුව ඔයා අපෙන් වෙන් වෙලා මෙහෙ අවිත් දැන් අවුරුදු 5ක් වෙනවානේ දැන් වත් ආපහු ගෙදර එන්න නංගී අපි ආවේ ඒක කියන්න මොකද අඇත්තටම මට අම්මයි තාත්තයි එහෙම ඉන්නවා

බලන් ඉන්න අමාරුයි දැන් වත් ආපහු ගෙදර එන්න න0ගී අපි ආවේ ඒක කියන්න මොකද ඇත්තටම මට අම්මයි තාත්තයි එහෙම ඉන්නවා බලන් ඉන්න අමාරුයි ඔයා හිතල බලලා තීරණයක් ගන්න න0ගී අපි යන්නම් අම්මයි තාත්තයි බලන් ඉන්නවා''

# දින කිහිපයකට පසු,

ගෙදර කවුද...................????

''ඔයාට අපිව එහෙනම් මතක් උනා නේද''ලෙවනායාව ලෙවනායාගේ අම්මා සිප ගනිමින් කීවේය.

'' සුරාෂ්.......... සුරාෂ්......... මේ බලන්න්කෝ කවුද ඇවිල්ල ඉන්නේ කියල. ''

''අනේ...........දුව..........''

තාත්තාද ඇයව පපුවට තුරුල් කර ගනිමින් කිවුවා.

''අනේ දුව ඔයා ආය යන්නේ නෑ නේද අනේ මගේ මැනික ආය නම් යන්න එපා අපිට පිස්සු හැදෙයි''

''නෑ අම්ම මම ආයේ යන්නේ නෑ''

''හරි දුවේ ගිහින් කාමරෙන් ඇඳුම් ටික තියල එන්නකෝ''

''ඔයාට දැන් පේනවද න0ගී ඔයා නිසා අම්මයි තාත්තයි කොච්චර සතුටින්ද ඉන්නේ කියල''

''ඔව් අයියේ ආය මම යන්නේ නෑ මම මට පුලුවන් විදියට අම්මවයි තාත්තවයි සතුටින් තියනවා ''

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක


2023 . 11 . 01